**විගමණික ශ්‍රමික දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම.**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී මේ වන විට විදේශගතව සිටින හා විදෙස්ගතව සේවය කර මෙරටට පැමිණි අඩු ආදායම්ලාභී විගමනික ශ්‍රමික මහත්ම මහත්මීන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට කාර්යාංශයේ සුබසාධන අංශයෙන් ක්‍රියාත්මක කරන වැඩසටහනකි.

- ❖ විගමනික ශ්‍රමික දෙමාපියන් විසින් දූ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා වෙනුවෙන් ඔවුන් දරන පිරිවැයට සහනයක් ලබා දීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.
- ❖ ඒ අනුව, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු අනුගමනය කළ යුතු අතර, කාර්යාංශ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ද්‍රව්‍යමය උපකරණ ලෙස මෙතෙක් ලබා දුන් පාසල් උපකරණ, බෑග් හා සපත්තු වෙනුවට රු.10,000.00ක වටිනාකමින් යුතු වවුචර් ලබා දීමට තීරණය කර ඇත. මෙම වැඩසටහන සඳහා 2026.10.26 දින සිට 2026.12.11 දින දක්වා අයදුම් කළ හැක.

**01. විගමණික ශ්‍රමික දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමට අදාළ නිර්ණායක**

I. මේ සඳහා සුදුසුකම් ලබනුයේ විගමණික ශ්‍රමික දෙමාපියෙකුගේ දරුවන් පමණි.

II. අදාළ විගමණික ශ්‍රමික මහතා / මහත්මිය කාර්යාංශ ලියාපදිංචිය ලබා විදේශගත වූ අයෙකු විය යුතුය.

III. කාර්යාංශ දත්ත පද්ධතියට අනුව අදාළ සේවක මහතාගේ හෝ මහත්මියගේ මාසික වැටුප ඇමරිකානු ඩොලර් 400 හෝ ඊට අඩු විය යුතුය.

IV. විදේශගතව රැකියා කරන්නේ නම් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගත් දින සිට වසරක කාලයක් ඉකුත්වීමෙන් පසුවය.

V. විදේශගතව සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති ශ්‍රමිකයෙකු නම් අවම වශයෙන් වසරකට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කර තිබිය යුතු අතරම ලංකාවට පැමිණ වසර 03 නොඉක්මවා තිබිය යුතුය.

VI. විගමණික ශ්‍රමිකයාගේ දරුවා මීට පෙර පාසල් උපකරණ ආධාර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා නොගත් අයෙකු විය යුතුය.

VII. රජයේ හෝ පුද්ගලික පාසලක අධ්‍යාපනය හදාරණ 01 වසර සිට 12 වසර දක්වා දරුවන් මේ සඳහා සුදුසුකම් ලබයි.

VIII. පාසල් නොයන විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ටද අදාළ වෛද්‍ය නිර්දේශ මත අධ්‍යාපන උපකරණ ලැයිස්තුවක් පිරිවිතර හා නිර්ණායකවලට යටත්ව ඉල්ලුම් කළ හැකිය.

IX. අයදුම්පත් සංවර්ධන නිළධාරී (විදේශ රැකියා) වෙත භාර දීමට අයදුම්කරුවන් විසින් කටයුතු කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ.

**02.ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛණ:**

I. අයදුම්පත්‍රය

II. පාසලේ විදුහල්පතිගේ නිර්දේශය

III. දරුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්

IV. විගමණික ශ්‍රමිකයාගේ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුවේ ඡායා පිටපතක්

V. විදේශගත වූ සහ නැවත පැමිණි ආගමන විගමණ මුද්‍රා සහිත පිටු (ලංකාවට පැමිණි අය සඳහා)

VI. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිළධාරී සහතිකය

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

(සැ.යු -: දරුවන් එක් අයෙකුට වඩා සිටී නම් එක් එක් දරුවා සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.)

1.විදේශගත / විදේශගතව සිටි තැනැත්තාගේ සම්පූර්ණ නම -:
.......................................................................................................................................

2.ලිපිනය - : .......................................................................................................................

3.විදේශ ගත වූ දිනය - : ........................................................................................................

4.විදේශ ගතව සිට මෙරටට නැවත පැමිණි දිනය - ......................................................................

(විදේශ ගතව සිට නැවත මෙරටට පැමිණ අයදුම් කරන්නන් සඳහා පමණි.)

5.හැඳුනුම්පත් අංකය - : ........................................................................................................

6.ගමන් බලපත්‍ර අංකය - : .....................................................................................................

7.ග්‍රාම නිලධාරී කොට්ඨාශය - : ...............................................................................................

8.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - : ............................................................................................

9.දිස්ත්‍රික්කය - : ....................................................

10.පළාත - : ...........................................................

11.විදේශගත අයගේ මාසික වැටුප -..........................................

(අදාළ රටේ මුදල් ඒකක මඟින් හෝ ඇ.ඩොලර් වලින් දැක්විය යුතු වන අතර, විදේශ ගතව සිට නැවත මෙරටට පැමිණි අයදුම්කරුවන් විසින් සේවයේ යෙදී සිටියදී ලබාගත් මාසික වැටුප සඳහන් කළ යුතුය.)

12.පාසල් උපකරණ ඉල්ලුම් කරනු ලබන දරුවාගේ සම්පූර්ණ නම - :
.......................................................................................................................................

13.2027 වර්ෂය සඳහා ඉගෙනුම ලබන ශ්‍රේණිය - :...................................

**14.මව/පියා/භාරකරුගේ ප්‍රකාශය**

ඉහත නම සඳහන් දරුවාහට ඉදිරි අධ්‍යාපන වර්ෂය සඳහා අවශ්‍ය අධ්‍යාපන උපකරණ ලබා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බැවින්, දරුවා හට ඉදිරි අධ්‍යාපන වර්ෂය සඳහා අධ්‍යාපන උපකරණ ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන්ද, එමෙන්ම මීට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබාදෙන අධ්‍යාපන උපකරණ ලබාගෙන නොමැති බවත්, ඉහතින් සඳහන් කල තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බවත් ප්‍රකාශ කරමි.

මවගේ/පියාගේ/භාරකරුගේ නම -:
.............................................................................................

දුරකථන අංකය -: ........................................................................................

අත්සන -: ........................................ දිනය -: ........................................

**15.ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිගේ නිර්දේශය**

........................................................................................................ පාසලේ ..........................
ශ්‍රේණියේ ඉගෙනුම ලබන ........................................................................................ ශිෂ්‍යයා /ශිෂ්‍යාව සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ලබාදෙන පාසැල් උපකරණ ඉදිරි අධ්‍යාපන වර්ෂය සඳහා ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි. (රු.10,000.00ක උපරිමයකට යටත්ව)

........................................................ ....................................
විදුහල්පතිගේ අත්සන හා දිනය නිල මුද්‍රාව

**16.සංවර්ධන නිලධාරීගේ (විදේශ රැකියා) නිර්දේශය**

නිර්දේශ කරමි ☐ නිර්දේශ නොකරමි ☐

.......................................................................
සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) නම හා දිනය

...................................................................
අත්සන හා නිල මුද්‍රාව

**17.සංවර්ධන නිලධාරී ඉහත නිර්දේශය මත පාසල් උකරණ කට්ටල ලබා දීම අනුමත කරමි / නොකරමි.**

..................................................................
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන,දිනය හා නිල මුද්‍රාව

**18.මෙම දරුවාගේ මව/පියාගේ විදේශගත රැකියාවේ වැටුප කාර්යාංශයේ ලියාපදිංචි දත්ත අනුව ඇ.ඩොලර් 400 ට අඩු බැවින් හා ඉහත නිර්දේශ හා අනුමැතීන් මත පාසල් උපකරණ ලබා දීම සුදුසුබව නිර්දේශ කරමි / නොකරමි.**

..................................................................
ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ අත්සන,දිනය හා නිල මුද්‍රාව

**මෙම අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ලියකියවිලි**

1. දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත (සංවර්ධන නිලධාරී විදේශ රැකියා විසින් සහතික කළ යුතුය.)
2. විදේශගත පුද්ගලයාගේ ගමන් බලපත්‍රයේ ජීවදත්ත ඇතුළත් පිටුවෙහි (Photo page) පිටපතක්
3. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය